පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம் (மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. LGD/2A/පොදු | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2020.03.21 |

බස්නාහිර පළාත්
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

<u>බස්නාහිර පළාත තුළ Covid-19 වෛරසය පැතිරයාම වැලැක්වීම අවශ්‍ය ධූමායන යන්ත්‍ර බෙදාදීම</u>

ශ්‍රී ලංකාව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කොරෝනා වෛරසයෙන් වැඩි වශයෙන් බලපෑම් එල්ල වී ඇති බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්කයන්හි වෛරසය තවදුරටත් ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා එම සියලු ප්‍රදේශයන් ධූමායනය කිරීමට අවශ්‍යව ඇත.

02. ඒ අනුව මෙම වසංගත තත්ත්වය මැඩපැවැත්වීම සම්බන්ධයෙන් මගේ සමාංක හා 2020.03.21 දිනැති ලිපිය මගින් වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් කරන ලද ඉල්ලීමට කඩිනම් පියවර වශයෙන් බස්නාහිර පළාතේ සියලු ම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් මගින් එක් දිස්ත්‍රික්කයකට ධූමායන යන්ත්‍ර 200ක් බැගින් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

03. වැඩ බලන පොලිස්පතිතුමාගේ ඉල්ලීම් ප්‍රකාරව ඔබ බලප්‍රදේශයේ පොලිස් ස්ථානවලට අනිවාර්ය වන සේ එක් ධූමායන යන්ත්‍රයක් බැගින් හා පහත සඳහන් ආයතන නියෝජනය වන පරිදි අවශ්‍යතාව අනුව ධූමායන යන්ත්‍ර 01 බැගින් විධිමත් පරිදි බෙදාහැරීමටත්, එම ආයතන හා සහයෝගයෙන් බස්නාහිර පළාත තුළ ධූමායන කටයුතු ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

* රෝහල්
* සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල
* ප්‍රාදේශීය ලේකම් කාර්යාල
* බන්ධනාගාර

04. තව ද අවශ්‍ය අවස්ථාවන්වල දී සතොස හා සමුපකාර වෙළෙඳසැල් මගින් මහජනතාවට අත්‍යවශ්‍ය ආහාර මලු බෙදාහැරීමට අවශ්‍ය සහාය ලබාදීමට ද කටයුතු කරන මෙන් වැඩිදුරටත් සඳහන් කරමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 02. | පළාත් පාලන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 03. | බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ඊ.එච්.ඩබ්.දේශබන්දු තෙන්නකෝන් මහතා | - | කාරුණික දැ.ගැ.ස. |
| 04. | පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | - | පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණය සඳහා |



| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | පොදු / General | කොමසාරිස් / Commissioner | පාලන හා මානව සම්පත් / Admin / HR | නීති / Legal | සැලසුම් / Planning | ගිණුම් / Accounts | විමර්ශන / Investigation | ආයතන පරිපාලන / Establishment | ප්‍රජා සංවර්ධන / Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 2092577 | වෙබ් ලිපිනය / வெப்தளம் / Web | www.lgd.wpc.gov.lk | ඊමේල් / ஈமெயில் / Email | lgd@wpc.gov.lk |